# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,227—1964 නොවැම්බර් 16 වැනි සඳුදා—1964.11.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**1964 අංක ජී. 7 දරණ මිළ නියෝගය**

**පිරිසිදු කළ සුදු සීනි**

**මිළ පාලන පනත**

**නියෝගය**

ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත්, ගාර්දියෙ පුංචි හේවගේ බුද්ධදාස ද සිල්වා වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පණතේ, 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මාවෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1963 අගෝස්තු මස 14 වැනි දින අංක 13,728 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 අගෝස්තු මස 7 දින අංක ජී. 6 දරණ මිළ නියෝගය මෙදින සිට මෙයින් අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය මෙදින සිට දෙවෙනි උපලේඛණයේ පළමුවැනි තීරයෙහි සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ එහිම වූ දෙවැනි උපලේඛණයේ දෙවැනි තීරයෙහි සඳහන් මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය මෙදින සිට මෙයට යාකර ඇති දෙවෙනි උපලේඛණයේ පළමුවැනි තීරයේ සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එහිම වූ දෙවැනි උපලේඛණයේ තුන්වැනි තීරයෙහි සඳහන් මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙහි කාර්යය සඳහා—

(අ) පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකුණන ලබන කල්හි හෝ එසේ එක් වරෙක විකුණනු ලබන ප්‍රමාණය දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩිවන කල්හි එය තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) එම උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය පාරිභෝගය පිණිස දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍යයෙන් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා, එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියම කරන ලද වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සඳහන් කොට එම භාජනයට සම්බන්ධ කොට ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම, මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ද සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් මිලයට ගන්නා අය ඉල්ලා සිටි කල්හි පහත සඳහන් විස්තර අඩංගු කුවිතාන්සියක් ඔහුට දිය යුතු බවත් නියම කරමි.

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; හා
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද නැතහොත් සිල්ලර වශයෙන් ද යන වග,

(9) පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍යය විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිලත් දෙවැනි උපලේඛණයේ දෙවැනි සහ තෙවැනි තීරයන්හි සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද සඳහන් කරමි.

1964 නොවැම්බර් 10 වැනි දින ප.ව. 3ට ගාලු දිසාපති කාර්යාලයේ දී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක.

## පළමුවැනි උපලේඛනය

### හැඳින්වීම හා වර්ගය : පිරිසිදු කළ සීනි

### දෙවැනි උපලේඛණය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර, අක්මීමන ගම්කාර්ය සහා සීමාව, බෝපෙ ගම්කාර්ය සහා සීමාව, පෝද්දල ගම්කාර්ය සහා සීමාව ... ... ... ... | 72 90 ... | 0 68 |
| අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සහා සීමාව, වතුගෙදර සුලු නගර සහා සීමාව, වෙරගොඩ ගම්කාර්ය සහා සීමාව, බටපොල ගම්කාර්ය සහා සීමාව, කරන්දෙනිය ගම්කාර්ය සහා සීමාව, මාදම්පෙ ගම්කාර්ය සහා සීමාව ... ... ... ... ... | 72 76 ... | 0 67½ |
| අහංගම සුලුනගර සහා සීමාව, හබරාදූව ගම්කාර්ය සහා සීමාව, කෝද්දගොඩ ගම්කාර්ය සහා සීමාව, කොට්ටව ගම්කාර්ය සහා සීමාව, කතලුව ගම්කාර්ය සහා සීමාව ... ... ... | 72 95 ... | 0 68 |
| නෙලුව ගම්කාර්ය සහා සීමාව, ඕපාත ගම්කාර්ය සහා සීමාව, හිනිදුම ගම්කාර්ය සහා සීමාව ... | 73 10 ... | 0 68 |

### හැඳින්වීම හා වර්ගය : පිරිසිදු කළ සුදු සීනි

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| වදුරඹ ගම්කාර්ය සහා සීමාව, බද්දේගම ගම්කාර්ය සහා සීමාව, තෙලිකඩ–මාපුවාන ගම්කාර්ය සහා සීමාව ... ... ... ... ... ... | 72 86 ... | 0 68 |
| පිටිගල වැයිහේන ගම්කාර්ය සහා සීමාව, පෝද්දිවෙල–නියාගම ගම්කාර්ය සහා සීමාව, වැලිවිටිය දිවිතුරේ ගම්කාර්ය සහා සීමාව ... ... ... ... ... | 72 95 ... | 0 68 |
| දෙඩන්දූව සුලු නගර සහා සීමාව, රත්ගම ගම්කාර්ය සහා සීමාව ... ... ... | 72 81 ... | 0 68 |
| හික්කඩුව සුලු නගර සහා සීමාව, හික්කඩුව ගම්කාර්ය සහා සීමාව ... ... ... | 72 77 ... | 0 67½ |
| බලපිටිය සුලු නගර සහා සීමාව, ඌරගස්මංහන්දිය ගම්කාර්ය සහා සීමාව ... ... | 72 75 ... | 0 67½ |
| ඇල්පිටිය සුලු නගර සහා සීමාව, ඇල්පිටිය ගම්කාර්ය සහා සීමාව ... ... ... | 72 80 ... | 0 68 |
| නාගොඩ ගම්කාර්ය සහා සීමාව ... ... ... ... ... | 72 96 ... | 0 68 |
| කොස්ගොඩ ගම්කාර්ය සහා සීමාව ... ... ... ... | 72 69 ... | 0 67½ |
| බෙන්තොට ගම්කාර්ය සහා සීමාව ... ... ... ... | 72 63 ... | 0 67½ |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහලම මිළ ගණන්ය. මෙ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකි ය.

11–650

---

අංක : කේෂු/51/64/දරණ ආහාර මිළ නියෝගය

තිරිඟු පිටි

## මිල පාලන පනත

### ආඥාව

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, චාල්ස් අබේදීර වන මම "(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ" 4 වැනි ඡෙදය හා 3 (2) වෙනි ඡෙදයන් ගෙන්ද මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1963 අගෝස්තු මස 14 වැනි දින අංක 13,728 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද අංක : කේෂු/40/63 හා 1963 අගෝස්තු මස 7 වැනි දින දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(2) තවද, තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තල් 148 ක්ද, සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් පෙදෙස් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ තිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) තිරිඟු පිටි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 148කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) තිරිඟු පිටි හා ඉරිඟු පිටි එක ට කළවම් කළ විට එය "තිරිඟු පිටි" නමින් හැඟවෙන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, තිරිඟු පිටි හා ඉරිඟු පිටි හැර, වෙන කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් මෙයින් නියම කරමි.

(5) තවද, බරින් සියේට 10 කට වැඩියෙන් ඉරිඟු පිටි කලවම් කරන ලද තිරිඟු පිටි කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, තිරිඟු පිටි විකුණන විට යම් කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිලත්, මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බවද මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම තිරිඟු පිටිවලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, තිරිඟු පිටි තොග වශයෙන් විකුණන තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්:—

(අ) විකුණූ දිනය ;
(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(9) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1964 නොවැම්බර් මස 10 වැනි දින ප.ව. 3.00ට කුරුණෑගල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

චාල්ස් අබේදීර,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) පාලක.

## උපලේඛණය

| 1 වෙනි තීරය<br>විස්තර | 2 වෙනි තීරය<br>ප්‍රදේශය | 3 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තල් 148 තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|---|
| තිරිඟු පිටි | කුරුණෑගල නාගරික සීමාව තුළ | 34 30 | 0 24½ |
| | කුලියාපිටිය පලාත් ආණ්ඩු සීමාව තුළ | 34 79 | 0 25 |
| | පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුළ | 34 49 | 0 24½ |
| | අලව්ව ගම්කාර්‍ය සීමාව තුළ | 34 71 | 0 24½ |
| | බිංගිරිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 87 | 0 25 |
| | බෝයගනේ ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 30 | 0 24½ |
| | දඹදෙණිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 65 | 0 24½ |
| | දෙඩන්ගස්ලන්ද ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 55 | 0 24½ |
| | දුම්මලසූරිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 90 | 0 25 |
| | ගොකරැල්ල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 52 | 0 24½ |
| | හමන්ගල්ල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 79 | 0 25 |
| | හෙට්ටිපොල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 76 | 0 25 |
| | හිරිපිටිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 73 | 0 24½ |
| | හොරොම්බාව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 79 | 0 25 |
| | කලුගමුව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 38 | 0 24½ |
| | කනෝගම ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 71 | 0 24½ |
| | මාකඳුර ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 97 | 0 25 |
| | මුරුතැන්ගේ ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 79 | 0 25 |
| | නාරම්මල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 52 | 0 24½ |
| | පන්නල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 99 | 0 25 |
| | පිදුම ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 79 | 0 25 |
| | පිලැස්ස ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 38 | 0 24½ |
| | පොල්ගහවෙල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 49 | 0 24½ |
| | පොතුහැර ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 30 | 0 24½ |
| | රම්බොඩගල්ල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 63 | 0 24½ |
| | උඩුබද්දව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 90 | 0 25 |
| | වාරියපොල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 55 | 0 24½ |
| | වැල්ලව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 30 | 0 24½ |
| | වැළඩ ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 38 | 0 24½ |
| | අඹන්පොල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 58 | 0 24½ |
| | බලල්ල ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 58 | 0 24½ |
| | ඇහැටුවැව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 99 | 0 25 |
| | ගල්ගමුව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 77 | 0 25 |
| | මහනාන්නේරිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 77 | 0 25 |
| | මාහෝ ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 58 | 0 24½ |
| | නිකවැරටිය ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 77 | 0 25 |
| | පොල්පිටිගම ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 85 | 0 25 |
| | තඹරොම්බුව ගම්කාර්‍ය සභා සීමාව තුළ | 34 77 | 0 25 |

සටහන.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකි ය.

(2) ශුද්ධ බර රාත්තල් 148 කට අඩු හෝ වැඩි කිසියම් තිරිඟු පිටි ප්‍රමාණයක් තොග වශයෙන් විකුණන විට, ශුද්ධ බර රාත්තල් 148 තොග වශයෙන් විකිණිය හැකි ඉහත සඳහන් වැඩිම මිලේ අනුපාතය අනුව ගෙවිය යුතු මිළ ගණන් බැලිය යුතු ය.

11–651

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි